

# සිංහල ධර්ම සාහිත්‍යයේ ආරම්භය
## - අනුරාධපුර යුගය

රොක්බෑන්ක්හි පාරමිතා බෞද්ධ විහාරවාසී,
මහනුවර අස්ගිරි මහාවිහාර මහ පිරිවෙණේ ආචාර්ය,
**ඉඳිපරපේ ධම්මසිරි හිමි**



මහින්දාගමනයෙන් අනතුරු ව සිදු වූ ආගමික, සංස්කෘතික සහ සාමාජික පරිවර්තනය සිංහල ධර්ම සාහිත්‍යයේ ආරම්භයට අවශ්‍ය පසුබිම සකස් කළේය. විශේෂයෙන් බුදුදහමත්, සසුනත් මෙරට ස්ථිර ව පිහිටීම ඊට මහත් පිටුබලයක් විය. දෙවනපෑතිස් රජතුමන්ගෙන් ලත් රාජ්‍ය අනුග්‍රහය නිසා මහාවිහාරය කේන්ද්‍ර කර ගනිමින් වෙහෙර විහාර රැසක් බිහිවිය. බෞද්ධ දර්ශනයෙන් පෙන්වා දුන් විමුක්ති මාර්ගය අනුගමනය කරමින් හෙළදිව වැසියන් විශාල වශයෙන් පැවිදි වන්නට විය. ගිහි පැවිදි සියලු දෙනාට පාලි භාෂාවෙන් දේශිත සම්බුද්ධ ධර්මයේ ඇතැම් ධර්ම කාරණාවන් පිළිබඳ නිවැරදි අවබෝධය ලබා ගැනීම දුෂ්කර වූ නිසා ස්වදේශීය භාෂාවෙන් ඒ පිළිබඳ පැහැදිළි කර දීමට සිදු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මිහිඳු මහරහතන් වහන්සේගේ ද මග පෙන්වීමෙන් බුද්ධ ධර්මය විස්තර කර දීම සඳහා මහාවිහාරීය භික්ෂූන් වහන්සේලා අතින් අට්ඨකථාවන් හෙවත් අටුවා ග්‍රන්ථ රචනා විය. ඓතිහාසික තොරතුරු අනුව එසේ රචනා වූ සිංහල අට්ඨකථාවන් 05 ක් පිළිබඳ තොරතුරු හමුවේ.

| | |
|---|---|
| සග | කුරුන්දි අට්ඨකථා |
| සසග | මහා අට්ඨකථා |
| සසසග | මහා පච්චරිය අට්ඨකථා |
| සඩග | සංඛේපට්ඨ කථා |
| ඞග | අන්ධකට්ඨ කථා |

වර්තමානයේ මේ කිසිදු අටුවා ග්‍රන්ථයක පෙළ දැකිය නොහැකිය. ඊට හේතු ලෙස වියතුන් පවසන්නේ මහසෙන් රජු දවස මහාවිහාරය ගිනිබත් කර දැමූ නිසා ඇතැම් විට මෙම ග්‍රන්ථයන් විනාශ වන්නට ඇති බවයි. තවත් මතයක් වන්නේ අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ හිමියන් ක්‍රි.ව. 05 සියවසේ දී මෙම සීහලට්ඨ කථාවන් යළිත් පාලි භාෂාවට පරිවර්තනය කළ අතර මුල් ග්‍රන්ථ ආපසු යන විට රැගෙන ගිය බවයි. කෙසේ වෙතත් අපේ ධර්ම සාහිත්‍ය ඉතිහාසයේ ලියැවුණු මුල් ම ග්‍රන්ථයන් මේවා වන අතර එහි පසුකාලීන ව දක්නට ලැබෙන ආකාරයේ සාහිත්‍යයික ස්වරූපයක් අන්තර්ගත නොවන්නට ඇත. එසේ ම ලංකාවේ මුල් කාලයේ ලියැවුණු ග්‍රන්ථවලින් වැඩි හරියක් ම බුද්ධ ධර්මය විස්තර කර දීම සඳහා රචිත අටුවා, ටීකා, ටිප්පණීවලට අයත්ය.

හෙළබසින් ලියැවුණු කාව්‍ය ග්‍රන්ථයක් පිළිබඳ පළමුවැනි සටහන වන්නේ ක්‍රි.ව. 06 වැනි සියවසේ දෙවැනි මුගලන් රජු විසින් රචිත දහම් කව් පොතක් පිළිබඳ සඳහනයි. එසේ ම ඒ ආසන්න කාලවකවානුවේ පළමු අග්බෝ රජුන් දවස දෙළොස් මහා කවීන් යනුවෙන් හඳුන්වන ලද කවීන් පිරිසක් සිටි බව ද හෙළි වේ. තව ද 04 සියවසේ සිදු වූ දළදාගමනය පිළිබඳ ව එළුදළදා වංසය නමින් කාව්‍ය ග්‍රන්ථයක් පැවති බවට පොළොන්නරු යුගයේ වාචිස්සර නම් හිමිනමක විසින් 'හෙළ කවීන් විසින් ලියන ලද එළු දළදා වංසය බලා ..... යන සඳහන පෙන්වා දෙයි. සිංහල සාහිත්‍යයේ ආරම්භක අවධියේ දියුණුතම නිර්මාණයන් අපට හමුවන්නේ 07, 08, 09 යන සියවස්වල රචිත සීගිරි ගී තුළිනි. කෙසේ වෙතත් වර්තමාන පිළිගැනීමට අනුව අනුරාධපුර යුගයට අයත් පරිසමාප්ත සිංහල සාහිත්‍ය ග්‍රන්ථ 03 කි.

| | |
|---|---|
| සග | සියබස්ලකර |
| සසග | ධම්පියා අටුවා ගැටපදය |
| සසසග | සිඛවළඳ හා සිඛවළඳ විනිස |

මාර්ටින් වික්‍රමසිංහ මහත්මා වැනි බොහෝ උගතුන්ගේ පිළිගැනීම සියබස්ලකර නවවන සියවසේ අගභාගයේ පමණ රචනා කර ඇත යන්නයි. එවක රාජ්‍යය කරවූ සලමෙවන් රජතුමා සංස්කෘත ආලංකාරික ග්‍රන්ථයක් වන කාව්‍යාදර්ශයේ අභාසය ගෙන මෙය රචනා කර ඇත. පද්‍යකරණයෙහි නියුක්ත වන කවීන් අනුගමනය කළ යුතු කාව්‍ය රීති, කාව්‍යෝපක්‍රම ආදී වැදගත් කරුණු රැසක් මෙමගින් පැහැදිළි කර ඇත. මෙහි ප්‍රධාන ම රීතිය වන්නේ 'පෙදෙන් බුදු සිරිත - බසින් වත්සිරිත් ඈ ' - පද්‍ය නිර්මාණය කරන්නේ නම් බුද්ධ චරිතය හෝ බෝසත් චරිතය මුල් කරගත යුතුය යනුවෙනි. තත්කාලීන ව අනුරාධපුර රාජධානියේ පැවති දියුණු ආගමික තත්ත්වය මෙන් ම සීගිරි ගීවල දක්නට ලැබෙන ශෘංගාරාත්මක වර්ණනාවන් පද්‍යකරණය සඳහා මෙබඳු සීමාවක් පැනවීමට ආසන්න හේතුව වන්නට ඇත. ලෞකික, ශෘංගාරාත්මක පද්‍යයන් පුද්ගලයා තුළ ආධ්‍යාත්මික වර්ධනය පසුබට කරවයි. එවිට ගිලිහී යන්නේ සංස්කෘතික හර පද්ධතියයි. එබැවින් එය ආරක්ෂා කර ගැනීමේ අදහසින් චරිත සංවර්ධනයට ඉවහල් වන බුද්ධ හෝ බෝසත් චරිතයන්ගේ උතුම් ගුණධර්ම සාහිත්‍ය නිර්මාණයන් තුළින් ජනතාවට වඩාත් සමීප කරවීම සියබස්ලකර කතුවරයාගේ අභිප්‍රාය වන්නට ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස කෝට්ටේ යුගයේ අවසානය දක්වා ම රචිත මුව-දෙව්දාවත, සසදාවත, අසක්දාකව, කව්සිළුමිණ, කාව්‍යශේඛරය, ගුත්තිලය යනාදී පද්‍ය ග්‍රන්ථයන් රචනා වූයේ බුදුසිරිත ඇසුරු කරගෙනය.

පද්‍ය නිර්මාණයන් බුදුසිරිත ඇසුරු කරගනිමින් කළ යුතුයැයි යන්නෙන් ලෞකික වර්ණනා කිසි-සේත් සිදු නොකළ යුතුයයි දක්වා නොමැත. නිදසුනක් ලෙස කව්සිළුමිණෝ මධුපානෝත්සව, ගුත්තිල කාව්‍යයේ සුරඟන වැණුම අතිශය චමත්කාරජනක ලෙස නිර්මාණය කර තිබේ. බෞද්ධ තේමාවක් තුළ වුව ද බුදුදහමේ ගැඹුරු හරයන් කාව්‍යාත්මක ව ගෙන හැර පාන්නට හැකියාව ඇත. සුන්දරී නන්ද දෙ-දෙනාගේ ප්‍රේම වෘත්තාන්තය අතිශය රමණීය අන්දමින් විස්තර කරන සංස්කෘත මහාකා-ව්‍යයකි භදන්ත අශ්වඝෝෂයන්ගේ සෞන්දරනන්දය. එහි නන්ද කුමරු සහ සුන්දරී කුමරියගේ ප්‍රේමය ලෞකික රසයට මුල් තැන දෙමින් වර්ණනා කර ඇත. නන්ද කුමරු පැවිදි වූ පසුවත් සිය ප්‍රියාව පිළිබඳ සිතිවිල්ලෙන් පසුවෙයි. මේ අවස්ථාවේ දී බුදුරදුන් හේනක දැවී ගිය වැඳිරියක හා දිව්‍යාංගනාවන් පෙන්වා විමසන්නේ වඩාත් රූමත් සුන්දරිය ද ? දිව්‍යාංගනාව ද? යනුවෙනි. එහිදී බුදුරදුන්ට පිළිතුරු දෙන නන්ද පවසන්නේ දිව්‍යාංගනාවන් හා සසඳන විට සුන්දරිය හේනෙහි දක්නා ලද දැවුණු වැඳිරිය හා සමාන බවයි. මෙයින් අශ්වඝෝෂ හිමියන් ලෞකික බැඳීම්වල අස්ථීරතාව අපට වටහා දෙනු ලබයි. සෞන්දරනන්දය අවසන් කරන්නේ ''පාතුං තික්තමිවෞෂධං මධුයුතං හෘද්‍යං කථාං ස්‍යාදිති - බීමට අපහසු තිත්ත බෙහෙතක් මීපැණි ගල්වා දෙන්නාක් මෙන් රසවත් කථාවක් අනුසාරයෙන් යථාර්ථය පෙන්වා දෙන ලදී'' ඒ ආකාරයෙන් සිංහල කවීන් ද සිය රසවත්, ප්‍රතිභාසම්පන්න කාව්‍ය නිර්මාණයන් තුළින් බුදුසිරිත මතු කොට ආධ්‍යාත්මික ගුණ වර්ධනයට මග පෙන්වා දුන්හ. ලෞකික රස වින්දනය තුළින් යථාර්ථය අවබෝධ කරගන්නට පාඨක, ශ්‍රාවකයන්ගේ මනස අවදි කරවූහ.

සලමෙවන් රජතුමන් දූරදර්ශී ව සිතා බලා පද්‍ය නිර්මාණයේ දී බුදුසිරිත මුල් කොට ගත යුතු යැයි රීතියක් නොපනවන්නට අපට ධර්මසාහිත්‍යයක් බිහි නොවන්නට තිබුණි. සරල ව සලකා බැලුවහොත් කොළඹ යුගයෙන් පසු බිහිවුණු කවි, ගීත, නාට්‍ය ආදී බොහෝ නිර්මාණයන් කාලයත් සමග අභාවයට ගොස් ඇත. වර්තමානයේ සිංහල ගීත ක්ෂේත්‍රයට අලුතින් එකතු වන ගීත පැය විසිහතරක් යාමටත් මත්තෙන් ශ්‍රාවකයාට අමතක වේ. එහෙත් අදටත් අප සුවිශිෂ්ට ගණයේ ලා සලකන කවි, ගීත බොහොමයක බුදුදහමේ හර පද්ධතීන් අන්තර්ගත ව ඇත. කලාශූරී මොහිදීන් බෙග් ගායන ශිල්පියාණන්ගේ බුද්ධං සරණං ගච්ඡාමි .... යන ගීතය දශක පහකට පසුත් අදත් සම්භාවනාවට පාත්‍ර වීමෙන් ද, මනමේ වැනි ජාතක කථා ඇසුරින් නිපැයුණු නාට්‍ය හා සමවන්නට කිසිදු නව නිර්මාණයක් අද දක්වාත් බිහි නොවීමෙන් ද පසක් වන්නේ බුදුසිරිත ඇසුරු කරගත් නිර්මාණයන්ගේ විශිෂ්ටත්වය මෙන් ම අකාලික ගුණයයි.

**මතු සම්බන්ධයි .....**

**MONT ALBERT DENTISTS P/L**
**For all Your Dental Requirements**
We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES
WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.
FOR APPOINTMENTS
9890 3609
DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS
DR. ENOKA JAYATILAKEBANDA (BDS)
MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)
www.montalbertdentists.com.au